## සිසු සාධන මට්ටම් හඳුනාගැනීමේ තක්සේරුකරණය -2022

**මධ්‍යම පළාත**

**6 ශ්‍රේණිය** | **ගණිතය** | **කාලය - පැය 1 යි**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**


1. 48 294 යන සංඛ්‍යාවේ
   i. සංඛ්‍යා නාමය ලියන්න.
   ii. ඉහත සංඛ්‍යාවේ සියස්ථානයේ පිහිටි ඉලක්කම කුමක්ද?
   iii. එහි 8 ඉලක්කමෙන් නිරූපණය වන අගය ලියන්න.

2. පහත සංඛ්‍යා රටාවල හිස්තැන් පුරවන්න.
   i. 3, 8, 13, ………., ………..
   ii. ................., ..................., 31, 41, 51

3. දී ඇති සංඛ්‍යාවේ පෙර හා පසු සංඛ්‍යාව රෝම ඉලක්කමෙන් ලියන්න.
   ................, $XV$ , ................

4. $\frac{3}{10}$ දශම සංඛ්‍යාවක් ලෙස ඉලක්කමෙන් ලියා දක්වන්න.

5. $\frac{7}{10}$ යන භාග සංඛ්‍යාව පහත රූපයේ අඳුරු කර පෙන්වන්න.




mathematica.lk

6. අඹ ගොඩක අඹ ගෙඩි 32ක් ඇත. ඉන් $\frac{1}{4}$ ක් නරක් වී ඇත. එහි ඇති නරක් නොවුණු අඹ ගෙඩි ගණන කීයද?

7. තිස් පන් දහස් නවය යන සංඛ්‍යාංකය ලියා දක්වන්න.

8. රවුම තුළ ඇති ඉලක්කම් පමණක් භාවිතා කර සැදිය හැකි
   i. විශාලම සංඛ්‍යාව ලියා දක්වන්න.
   ii. කුඩාම සංඛාව ලියා දක්වන්න.





9. විසඳන්න.

| i. | ii. | iii. | iv. |
|---|---|---|---|
| $\begin{array}{r} 2138 \\ +\ 1986 \\ \hline \end{array}$ | $\begin{array}{r} 2851 \\ -\ 1492 \\ \hline \end{array}$ | $\begin{array}{r} 380 \\ \times\ 7 \\ \hline \end{array}$ | $5 \overline{)535}$ |

10. මීටර් වලින් ලියා දක්වන්න. $2\ Km\ \ 80\ \ m$

11. සිසුන් කණ්ඩායමක් තමන් වඩාත්ම කැමති පලතුරු වර්ගය පිළිබඳ ලබාගත් තොරතුරු පහත තීර ප්‍රස්තාරයේ දැක්වේ. එම ප්‍රස්තාරය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




mathematica.lk

i. වැඩිම සිසුන් ගණනක් කැමති පළතුර කුමක්ද?
ii. දිවුල් වලට කැමති සිසුන් ගණන කොපමණද?
iii. දිවුල්වලට වඩා අඹ වලට කැමති සිසුන් ගණන කොපමණද?
iv. පසුව කණ්ඩායමට එක් වූ සිසුන් 25 දෙනා කැමති පළතුර අන්නාසි නම් ඉහත ප්‍රස්තාරය තුළ එය ඇඳ දක්වන්න.
v. දැන් සිසුන් කණ්ඩායමේ සිටින මුළු සිසුන් ගණන කීයද?

12. සෘජුකෝණයට ගැළපෙන කෝණය කුමක්ද?



i. ii. iii. iv.

13. ග්‍රෑම් හා කිලෝග්‍රෑම් වලින් ලියා දක්වන්න. $1350\ g$

14. පහත වගුව සම්පූර්ණ කරන්න.

| | පැය 12 ඔරලෝසුව | පැය 24 ඔරලෝසුව |
|---|---|---|
| 1. | ප.ව. 1.30 | ............................. |
| 2. | ………………… | 20.30 |

mathematica.lk

15. දිලිප් පොත් සාප්පුවකට ගොස් රුපියල්. 65 ක් වටිනා පැන්සල් 2 ක් ද , රුපියල් 35 ක් වටිනා අභ්‍යාස පොත් තුනක් ද මිල දී ගනී.
i. ඔහු ගෙවිය යුතු මුළු මුදල කීයද?
ii. දිලිප් කඩයට රුපියල්. 500 යේ නෝට්ටුවක් දුන්නේ නම් ඔහුට ලැබෙන ඉතිරි මුදල කොපමණද?

16. එක් පීත්ත පටියක දිග $8\ m\ \ 70\ cm$ කි. තවත් පීත්ත පටියක දිග $6\ m\ \ 40\ cm$ කි. පීත්ත පටි දෙකේම මුළු දිග කොපමණද?

17. භාජනයක පළතුරු බීම $18\ l\ \ 700\ ml$ තිබුණි. එයින් $9l\ \ 800\ ml$ ක පරිමාවක් බීමට ගත් පසු ඉතිරි වූ බීම පරිමාව කොපමණද?

18. පුතෙකුගේ බර $12\ Kg\ \ 500\ g$ කි. පියාගේ බර පුතාගේ බර මෙන් පස්ගුණයකි. පියාගේ බර කොපමණද?

19. අමරා තම නිවසින් පෙ. ව. 6.15 ට පාසල් යාමට පිටත් විය. ඇය පෙ. ව. 7.00 ට පාසලට ළගා වූයේ නම් ඇයට පාසලට යාමට ගත වූ කාලය කොපමණද?

20. ඔබේ පන්තිකාමරයේ සිට ප්‍රධාන දිශා හතරෙහි තිබෙන ස්ථාන පිළිබඳව දළ සටහනක් ඇඳ දක්වන්න.

PARCEL NO

# LOL.lk BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**